# විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIS)

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමයි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIS) අධ්‍යක්ෂ තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

PGIS ආයතනය යනු, විද්‍යා ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි වැඩසටහන් හා පර්යේෂණ, ප්‍රවර්ධනය, සංවිධානය හා පැවැත්වීම යන කාර්ය උදෙසා 1996 වර්ෂයේදී ස්ථාපිත කළ ජාතික ආයතනයකි. PGIS ආයතනයේ වැඩසටහන්, අධ්‍යයන මණ්ඩලය එකොළහක් මගින් පවත්වනු ලැබේ. ජෛව රසායන විද්‍යා සහ අණුක ජීවවිද්‍යා; ජෛව වෛද්‍ය විද්‍යා; රසායනික විද්‍යා; භූමි විද්‍යා; පාරිසරික විද්‍යාව; ගණිතය; භෞතික විද්‍යා; පැලෑටි විද්‍යා; විද්‍යා අධ්‍යාපනය, සංඛ්‍යානය හා පරිගනක විද්‍යා සහ සත්ත්ව විද්‍යාත්මක විද්‍යා, වශයෙනි.

අපේක්ෂිත අයදුම්කරු, ඉහත සඳහන් විද්‍යා විෂය ක්ෂේත්‍රයන්හි කුමන හෝ එකක් සඳහා පර්චාත් උපාධි සුදුසුකම් සතු අයකු විය යුතු අතර, පර්යේෂණ හා පරිපාලන ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද සම්බන්ධ විශිෂ්ඨ සේවා වාර්තාවක් සතු අයකු විය යුතුය. ඔහුගේ වයස 2021 ඔක්තෝබර් 04 වන දිනට අවුරුදු 63 කට අඩු විය යුතුය. සාර්ථක අයදුම්කරු වෙත අධ්‍යයන නායකත්වය ලබාදීමේ වගකීම පවත්නා අතර, විශ්වවිද්‍යාලය තුළ පවත්නා අනෙකුත් සංවිධාන හා වෙනත් ජාතික හා ජාත්‍යන්තර ආයතන සමග ක්‍රියාකාරී සබඳතාවයන් පවත්වා ගත යුතුය. ඔහුහට බහුශික්සණ අධ්‍යයන පරිසරයක රාජකාරී ඉටුකිරීම සඳහා අවශ්‍ය විශිෂ්ඨ අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතු අතර, ප්‍රජාව වෙත ආයතනයේ පවත්නා වගකීම අවබෝධ කොටගෙන සිටිය යුතුය.

PGIS ව්‍යවස්ථාව අනුව, අධ්‍යක්ෂවරයා ආයතනයේ, පූර්ණකාලීන නිලධාරීයෙකු ප්‍රධාන විධායක නිලධාරිවරයා ප්‍රධාන අධ්‍යයන නිලධාරියා හා ගිණුම් නිලධාරියා වේ. අධ්‍යක්ෂවරයා, නිල බලයෙන් කළමනාකරණ මණ්ඩලයේ හා සම්බන්ධීකරණ කමිටුවේ සාමාජික හා සභාපති වන අතර, ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයක නිල බලයෙන් සාමාජිකත්වය දරයි. පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා, පත්වීම ලබන දිනයේ සිට වසර තුනක කාලයක් හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක් තනතුර හොබවනු ලබන අතර, මෙයින් පළමුවෙන් වන සිදුවීමේදී එය ක්‍රියාත්මක වනු ඇත.

ඉතා ඉහළ අධ්‍යාපන පසුබිමක් හා විශිෂ්ඨ පර්යේෂණ හා කළමනාකරණ සේවා වාර්තාවක් සතු මෙම අභියෝග ජයගැනීමට සමත් දක්මකින් යුත් පුද්ගලයකු බඳවා ගැනීම කළමනාකරණ මණ්ඩලයේ අපේක්ෂාවයි.

අපේක්ෂිත අයදුම්කරුවන් විසින්, තම උපන් දිනය, ප්‍රකාශණ ලැයිස්තුවක්, දැරූ පරිපාලන තනතුරු, අධ්‍යාපනික/ වෘත්තීය ජයග්‍රහණ පිළිබඳ විස්තර ආයතනයේ සංවර්ධනය සඳහා දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ මෙම තනතුරට පත්කරනු ලැබුවහොත් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු සම්බන්ධව කෙටි විස්තරයක් ද සහිතව පරිපූර්ණ කෙරුණු ඇතුළත් අයදුම්පතක් යොමු කළ යුතුය. එයට අමතරව, දැනට තනතුරේ සිටිනා අධ්‍යක්ෂවරයාද අයදුම්කරුවකු වෙතොත්, ඔහුගේ/ ඇයගේ තනතුර හෙබවීමේදී මෙතෙක් ලද ජයග්‍රහණ හුවාදක්වමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අදාළ අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් සහකාර ලේඛකාධිකාරී විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, තැ. පෙ. 25, පේරාදෙණිය යන ලිපිනයට 2021 ඔක්තෝබර් 04 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ "අධ්‍යක්ෂ තනතුර, විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කළ යුතුය. රජයේ සේවයේ සංස්ථාවල, ව්‍යවස්ථාපිත ආයතනවල හා උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් විසින් අදාළ අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි ද යන කරුණ සම්බන්ධව සේව්‍යයාගෙන් ලබාගත් ලිපියක්/ අයදුම්පත සමග තිබිය යුතුය.

අවශ්‍ය වැඩිදුර විස්තර, PGIS ආයතනයේ සහකාර ලේඛකාධිකාරී වෙතින්, දුරකථන අංක 081-2394782 මගින් හෝ ආයතනයේ වෙබ් අඩවිය වන www.pgis.lk වෙත පිවිසීමෙන් ලබාගත හැක.

**සහකාර ලේඛකාධිකාරී,**
**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**2021.09.05**

Source: Silumina, Sunday Observer (2021.09.05)